| | |
|---|---|
| සියලු ම හිමිකම් ඇවිරිණි) All Rights Reserved) | **මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්‍ෂණය- 2017** |
| | Primary Piriven Mid -Year Term Test - 2017 |
| | 03 වසර / Grade 03 |
| | **ත්‍රිපිටක ධර්මය** කාලය : පැය තුනයි |
| | **Tripitaka Dharmaya** Time : Three Hours |

- **I කොටසේ ප්‍රශ්න සියල්ලටම ද II, III ,IV කොටස්වලින් එක් ප්‍රශ්නයක්වත් ඇතුළත් වන සේ තවත් ප්‍රශ්න පහකට ද පිළිතුරු සපයන්න.**

## I - කොටස

01. **පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

i. බුදුරජාණන් වහන්සේගේ **අසරණ සරණ ගුණය** ප්‍රකටවන අවස්ථා හතරක් නම් කරන්න.
ii. බුදුරජාණන් වහන්සේගේ සිරුර ආදාහනය කිරීමෙන් පසු ඉතිරි වූ සප්ත ධාතූන් වහන්සේලා මොනවා ද?
iii. සූත්‍ර පිටකයට අයත් ග්‍රන්ථ හතරක් නම් කරන්න.
iv. පංචස්කන්ධය නම් කරන්න.
v. අෂ්ට දුෂ්ට ක්ෂණ අතුරින් (පින් කළ නොහැකි නොකල් 8 න් ) හතරක් නම් කරන්න.
vi. **දීඝං පස්ස මා රස්සං** මෙහි අර්ථය ලියන්න.
vii. සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතියට ක්‍රියාකල බුද්ධ කාලීන උපාසිකාවන් සිව්දෙනෙක් නම් කරන්න.
viii. **යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං** මෙහි අර්ථය ලියන්න.
ix. තව පංචකය නම් කරන්න.
x. බුද්ධ කාලීන මහාරාජ්‍ය හතර නම් කරන්න.

**(ලකුණු 4 x 10 = 40)**

## II- කොටස

02. i. කොසොල් රජුගේ අසදෘශ මහා දානය පිළිබඳ විස්තරයක් කරන්න.
ii. පහත සඳහන් මාතෘකාවන්ගෙන් දෙකකට කෙටිසටහන් ලියන්න.

i. චූල සුභද්‍රා ii. මට්ටකුණ්ඩලී
ii. රජ්ජුමාලා iv. කුමාර කස්සප මාතා

**(ලකුණු 4 + 4+ 4 = 12)**

03. පහත සඳහන් ගාථාවන් අතුරින් දෙකක් සම්පූර්ණ කර එක් ගාථාවක නිදාන කථාව ලියන්න.
i. දූරංගමං එකචරං......
ii. යථාපි භමරො පුප්ඵං.....
iii. න පරෙසං විලොමානි.....
iv. දුන්නිග්ගහස්ස ලහුනො.....

**(ලකුණු 4 + 4+ 4 = 12)**

04. i. **''පුනප්පුනං ජායති මීයතී ච - පුනප්පුනං සීවථිකං හරන්ති''**
**''මග්ගඤ්ච ලද්ධා අපුනබ්භවාය - න පුනප්පුනං ජායති භූරිපඤ්ඤො''** මෙම ගාථාවෙහි අර්ථය ලියන්න.

ii. " ලෝකයෙහි සියල්ල නැවත නැවතත් සිදුවෙයි." මෙම ප්‍රකාශය උදය සූත්‍රය ඇසුරින් පහදන්න.

**(ලකුණු 5 + 7 = 12)**

## III - කොටස

05. i. ''සතර සම්‍යක් ප්‍රදන් වීර්ය'' නම් කරන්න.

ii. ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි එන **සම්මා කම්මන්තය** විස්තර කරන්න. **(ලකුණු 4 + 8 = 12)**

06. i. විහාර මහා දේවියගේ උදාර ක්‍රියාවන් හතරක් ලියන්න.

ii මිහිඳු මහරහතන් වහන්සේගෙන් ශ්‍රී ලංකාද්වීපයට සිදු වූ මෙහෙවර අගයන්න.

**(ලකුණු 4 + 8 = 12)**

07. i. බුද්ධ කාලීන මහාරාජ්‍ය සතරෙහි අගනගර නම් කරන්න.

ii. බුද්ධකාලීන භාරතීයි ආගමික පරිසරය පිළිබඳ විග්‍රහයක් කරන්න.

**(ලකුණු - 4 x 8 = 12)**

## IV - කොටස

08. i. **කාමච්ඡන්දාදී පච්චනික ධම්මෙ සමෙතීති සමථො** මෙම පාඨයෙහි අර්ථය ලියන්න.

ii. සමථ - විදර්ශනා භාවනා පිළිබඳ විස්තරයක් කරන්න.

**(ලකුණු 4 + 8 = 12)**

09. i. **අන්තරසර, සමසූපකං, පාදුකා, පත්තසඤ්ඤී** යන පදවල අර්ථ ලියන්න.

ii. දන් වැළඳීමේදී අනුගමනය කළයුතු පිළිවෙත් **ඛම්භකත වග්ගය** ඇසුරින් විස්තර කරන්න.

**(ලකුණු 4 + 8 = 12)**

10. පහත සඳහන් මාතෘකා අතුරින් තුනකට කෙටි සටහනක් ලියන්න.

i. සතර පරමාර්ථ
ii. දිට්ඨිගත සම්පයුත්ත
iii. චක්ඛු විඤ්ඤාණය
iv. කාමච්චර සිත
v. ලෝභ මූල සිත්
vi. අභිධර්ම පිටකය

**(ලකුණු - 4 + 4+ 4 = 12)**